# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2021-02-01 |

පැමිණිලි පාර්ශවය : වයි. සුනේත්‍රා සෙනරත් මිය,
උළුක්කුලම, මහබුලන්කුලම,
අනුරාධපුර.

වගඋත්තර පාර්ශවය : 01. ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
මධ්‍යම නුවරගම් පළාත,
පණ්ඩුලගම, අනුරාධපුර

02. විශ්‍රාම වැටුප් නිලධාරිනී,
විශ්‍රාම වැටුප් අංශය,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මධ්‍යම නුවරගම් පළාත,
පණ්ඩුලගම, අනුරාධපුර.

පැමිණිලි අංකය :- ***HRC/AP/376/2015(S)***

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම පුතා වන සෙ/367876 සාසෙ බණ්ඩාර *E.G.C.P.* යන අයගේ මිය යාමෙන් පසු යැපෙන්නන් වෙනුවෙන් ගෙවනු ලබන දීමනාවෙන් කොටසක් පැමිණිලිකාරිය හට ලද බවත්, අදාළ දීමනාව ලබා ගත්තේ මධ්‍යම පළාතේ, දවුලගල ප්‍රාදේශීය කාර්යාලයෙන් බවත්ය. තම විවාහයේ දික්කසාදය ලැබීමෙන් පසු පැමිණිලිකාරිය අනුරාධපුර මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචි තම නැගණියගේ නිවස වෙත පැමිණි බවත්, එහි පැමිණීමෙන් පසු අදාළ දීමනා ගොනුව මධ්‍යම නුවරගම් පළාත අනුරාධපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවන ලද බවත්, මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමන්ට හිමි



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

යැපෙන්නන්ගේ දීමනාව 2015 ජනවාරි සිට ලබානොදී අසාධාරණයක් සිදුකරන බවත්ය. මේ පිළිබඳව සොයා බලා සාධාරණය ඉටුකර දෙන ලෙසට පැමිණිල්ලෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු දන්වමින් 2014.09.16 දිනැති වාර්තාව මඟින් වගඋත්තර පාර්ශවය දන්වා ඇත්තේ, පැමිණිලිකාර වයි. සුනේත්‍රා සෙනරත් මහත්මිය වෙත ලබාදුන් යැපෙන්නන්ගේ දීමනාව ඇයගේ උඩරට විවාහය අවලංගු කිරීමේ ඔප්පු පිටපතේ "ඇය වෙනත් පුරුෂයෙකු සමඟ යාම" යන කරුණු හේතුකොට ගෙන නතර කර ඇති බවය.

එමෙන්ම මෙම හේතුව සඳහන් කරමින් වැඩිදුර උපදෙස් ලබා ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගොනුව යවන ලද බවත්, ඒ අනුව යුධ හමුදා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 19(16) ආ අනුව ගෙවීම අත්හිටුවන ලෙසට උපදෙස් ලැබී ඇති බවත්, ඒ අනුව අදාළ ගෙවීම අත්හිටුවා ඇති බවත් සඳහන් කර ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාවේ විමර්ශනය :-**

මිය ගිය හමුදා සෙබල 367876 *E.G.C.P.*බණ්ඩාර යන අයගේ යැපෙන්නෙකු වන පැමිණිලිකාර වයි.සුනේත්‍රා සෙනරත් වෙත යැපීම් දීමනා ලැබී ඇති අතර, පැමිණිලිකාරිය 2014.06.10 වන දින තම නීත්‍යානුකූල ස්වාමියාගෙන් නීත්‍යානුකූලව වෙන් වී ඇත.

නමුත් පසු අවස්ථාවකදී පැමිණිලිකාරිය චාරිත්‍රානුකූල විවාහයකට ඇතුළත්ව ඇති බව දන්වමින් පැමිණිලිකාරිය වෙත ලද යැපීම් දිමනා අත්හිටුවා ඇත. වයි.සුනේත්‍රා සෙනරත් පැමිණිලිකාරිය නීත්‍යානුකූල හා චාරිත්‍රානුකූල විවාහයකට ඇතුලත්ව නොමැති බව 281 ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරී විසින් තහවුරු කර ඇත.

ප්‍රාදේශීය ලේකම්, මධ්‍යම නුවරගම් පළාත විසින් පැමිණිලිකාරිය සිරිත් විවාහයකට ඇතුලත්ව නොමැති බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත 2015.01.21 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. එසේම පැමිණිලිකාරිය වෙත යැපීම් දීමනාව ගෙවීම සුදුසු බව නිර්දේශ කර ප්‍රදේශීය ලේකම් විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ලිපියක් යවා ඇත. ඒ අනුව පැමිණිලිකාරියට හිමි යැපීම් දීමනාව නතර කළ දින සිට අදාළ හිඟ මුදල්ද ගණනය කර ගෙවන ලෙස දන්වා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ප්‍රාදේශීය ලේකම්, මධ්‍යම නුවරගම් පළාත වෙත දන්වා එවා ඇත.

නමුත් ප්‍රාදේශීය ලේකම්, මධ්‍යම නුවරගම් පළාතගේ 2017.06.28 දිනැති ලිපිය මඟින් නැවත විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත පැමිණිලිකාරියට හිමි යැපීම් දීමනා ගෙවීමට නොහැකි බව දන්වා යවා ඇත.

නිරීක්ෂණ :-

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මඟින් ප්‍රධාන කොටම ප්‍රකාශ කර ඇත්තේ, මිය ගිය හමුදා සෙබළා වන තම පුතාගේ යැපෙන්නන් වෙත ලැබෙන දීමනාව 2015 ජනවාරි මස සිට ලබාදීම අත්හිටුවා ඇති බවත්, එමගින් තම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්ය.

වගඋත්තරකරු මේ සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ නීත්‍යානුකූල විවාහය දික්කසාද කිරීමේ සහතිකයේ දික්කසාදයට හේතුව "බිරිඳ වෙනත් පුරුෂයෙකු සමඟ යාම" යනුවෙන් සඳහන්වීම මත පැමිණිලිකාරියට යැපෙන්නන්ගේ දීමනාව හිමි නොවන බව නිර්දේශ කළ බවත්, එමගින් පැමිණිලිකාරියට අසාධාරණයක් සිදුව නොමැති බවත්ය.

පැමිණිලිකාරියගේ පුතා වන *E.G.C.P.*බණ්ඩාර යන අය යුධ හමුදා සේවයේ යෙදී සිටියදී මිය ගොස් ඇති බැවින් හා මිය ගිය යුධ හමුදා සෙබලා අවිවාහකයෙකු වූ බැවින් හමුදා සෙබලාගේ යැපෙන්නන් හට හිමිවන දීමනාව යුධ හමුදා සෙබලාගේ පැමිණිලිකාර මවට හා පියාට සමව බෙදා දී ඇත. යුධ හමුදා සෙබලාගේ මව හා පියාගේ උඩරට විවාහය 2014.06.04 දින වලංගු කිරීමේ ඔප්පුවේ දික්කසාදයට හේතුව ලෙස 'බිරිඳ වෙනත් පුරුෂයෙකු සමඟ යාම' යන කාරණය දක්වා ඇති අතර, පැමිණිලිකාරියගේ කසාදය අවලංගු වීමෙන් පසු පැමිණිලිකාරිය අනුරාධපුර මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදිංචි තම නැගණියගේ නිවස වෙත පැමිණ ඇත. මෙහි පැමිණීමෙන් පසු අදාළ යැපෙන්නන්ගේ දීමනා ගොනුව මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් වෙත ගෙන්වා ගෙන ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය චාරිත්‍රානුකූල විවාහයක් සිදුකර ගෙන සිටින බව දන්වා පැමිණිලිකාරියට හිමි යැපෙන්නන්ගේ දීමනාව අත්හිටුවීමට ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

අනතුරුව අදාළ වසම භාර ග්‍රාම නිලධාරී විසින් පැමිණිලිකාරිය පදිංචි වසමේ කිසිදු නීත්‍යානුකූල හෝ චාරිත්‍රානුකූල විවාහයකට ඇතුලත්ව නොමැති බව ප්‍රාදේශීය ලේකම් වෙත දැන්වීමෙන් පසු නැවත පැමිණිලිකාරියට යැපෙන්නන්ගේ දමනා ලබාදීමට නිර්දේශ කර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ලිපි යොමුකර ඇත.

අනතුරුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් පැමිණිලිකාරියට හිඟ දීමනාද සහිතව යැපෙන්නන්ගේ දීමනාව ලබා දෙන ලෙස දන්වමින් නැවත ගොනුව මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් වෙත එවා ඇත.

නමුත් ප්‍රාදේශීය ලේකම් විසින් පැමිණිලිකාරියගේ උඩරට විවාහය අවලංගු කිරීමේ නිවේදනයේ "බිරිඳ වෙනත් පුරුෂයෙකු සමඟ යාම" යන හේතුව මත විවාහය අවලංගු වී ඇති බවට කරුණු දන්වමින් පැමිණිලිකාරියට හිමි යැපෙන්නන්ගේ දීමනා ලබාදීමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ විසින් ගෙන ඇති තීරණයට එරෙහිව නැවත කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

යුධ හමුදා සේවයේ යෙදී සිටියදී අවිවාහක තත්වයෙන් මිය යන හමුදා සෙබලුන්ගේ දෙමාපියන්ට හිමිවන යැපෙන්නන්ගේ දීමනාව පැමිණිලිකාරියට ලබා නොදීමට ඉහත වගඋත්තරකරුවන් දෙපල විවිධ හේතු දක්වමින් කටයුතු කරන බව නිරීක්ෂණය වන අතර, වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාරිය මේ දක්වා කිසිදු නීත්‍යානුකූල හෝ චාරිත්‍රානුකූල/සිරිත් විවාහයකට ඇතුලත්ව ඇති බවට වන කරුණු සනාථ කර ගෙනද නොමැති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

කරුණු එසේ තිබියදී අවිවාහකව මිය යන හමුදා සෙබලුන්ගේ යැපෙන්නනට හිමි වන දීමනාව කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අත්හිටුවීමට වගඋත්තරකරුවන් දෙපල විසින් ගෙන ඇති තීරණය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකාරියට හිමි හිඟ දීමනාද සහිතව යැපෙන්නන්ගේ දීමනාව ලබා දීමට පියවර ගත යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත නිර්දේශ කරනු ලැබේ.

2021. 03. 01 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anushya Shanmuganathan
Commissioner
Human Rights Commission of Sri Lanka

මහා.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal ...
Commissioner
Human Rights Commission of Sri Lanka

B/h